## මධ්‍යම පළාත් සභාවට අනුයුක්ත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය

**01 හැඳින්වීම**

මධ්‍යම පළාත් සභාවට අනුයුක්තව මධ්‍යම පළාත් පාසල්වල සේවය කරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සියලුම නිලධාරීන්ගේ සේවා ස්ථාන මාරු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කල යුතු විධිවිධාන නියම කිරීම සඳහා වූ පරිපාටියයි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද කාර්ය පටිපාටික රීති I වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 251 රීතියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I, II සහ III පන්තියේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය ජාතික මට්ටමින් ක්‍රියාත්මක අතර, එය අභිබවා නොයන පරිදි සකසා ඇති මෙම ස්ථාන මාරු පරිපාටියට අනුව මධ්‍යම පළාත තුළ ස්ථාන මාරු ක්‍රියාත්මක කෙරේ.

**02 ක්‍රියාත්මක වන දිනය** - මෙම පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමා අනුමත කරන දින සිට ක්‍රියාත්මක වේ.

**03 අරමුණ** - මධ්‍යම පළාත් සිසු දරුවන්ගේ අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනය මෙන්ම පාසල් පද්ධතිය මනා පරිපාලනයකින් පවත්වාගෙන යාම

**04** මෙම ස්ථාන මාරු පරිපාටිය මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට අනුයුක්ත කර පළාත් පාසල් වෙත ස්ථාන ගත කර ඇති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් මධ්‍යම පළාතේ පළාත් සභා පාසල් අතර ස්ථාන මාරු කිරීම සඳහා අදාළ වන වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය වේ.

**05.** මෙම ස්ථාන මාරු පරිපාටියට අනුව මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන ස්ථාන මාරු මණ්ඩලයක් මඟින් වාර්ෂික ස්ථාන මාරු සඳහා කැඳවනු ලබන අයදුම්පත් සහ අනෙකුත් විස්තර සළකා බලා ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කෙරේ.

**06 වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධාරීන් පිළිබඳ විස්තර**

6.1 මධ්‍යම පළාත් පාසල් වල සේවය කරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I, II සහ III ශ්‍රේණියේ නිලධාරීන්,

- විදුහල්පති
- නියෝජ්‍ය විදුහල්පති
- සහකාර විදුහල්පති

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024-07-25 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම් (ශා. අ.)
කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර



Scanned with CamScanner

### 6.2 සේවා ස්ථානයක සම්පූර්ණ කළ යුතු සේවා කාලය

ජේබිය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 2005/1 දරණ චක්‍රලේඛයෙහි පාසල් වර්ගීකරණයට අනුව පහත පරිදි සේවා කාලයන් සම්පූර්ණ කරන ලද නිලධරයන් ස්ථානමාරු අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

6.2.1 අතිදුෂ්කර - අවම අවුරුදු 03
6.2.2 දුෂ්කර - අවම අවුරුදු 04
6.2.3 අපහසු නොවන - අවම අවුරුදු 05
6.2.4 ප්‍රියමනාප/පහසු - උපරිම අවුරුදු 08
6.2.5 ඉතා ප්‍රියමනාප/ වඩාත් පහසු - උපරිම අවුරුදු 06

ඔබ අතිදුෂ්කර/ දුෂ්කර සේවා ස්ථානයක සේවය කිරීමට යටත් වන අතර, ඉන් පසු ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප පාසලකට ස්ථාන මාරු විය හැකිය. එහි වසර 06ක කාලයක් සේවය කිරීමෙන් පසුව ද යළි දුෂ්කර පාසලක අවුරුදු 03ක් හෝ අපහසු නොවන පාසලක අවුරුදු 04ක කාලයක් සේවය කිරීම සඳහා යෙදවිය හැකිය.

6.2 (අ) 6.2.1 හා 6.2.2 පරිදි සේවා කාලයන් සම්පූර්ණ කර ඇති නිලධරයන් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

6.2 (ආ) 6.2.3 ,6.2.4 හා 6.2.5 පරිදි සේවා කාලයන් සම්පූර්ණ කර ඇති නිලධරයන් අනිවාර්යයෙන්ම ස්ථාන මාරුවීම් වලට යටත්වේ.

### 6.3 සේවා ස්ථාන වර්ගීකරණය

ජේබිය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2005/1 චක්‍රලේඛය අනුව සහ එයට අදාළ වන සංශෝධන ඇතුළත්ව සියලුම පාසල් පහත පරිදි වර්ග කරනු ලැබේ.

6.3.1 අතිදුෂ්කර
6.3.2 දුෂ්කර
6.3.3 අපහසු නොවන
6.3.4 ප්‍රියමනාප/පහසු
6.3.5 ඉතා ප්‍රියමනාප/වඩාත් පහසු

ප්‍රියමනාප/ඉතා ප්‍රියමනාප පාසල්වල සේවය කරන නිලධරයන් විසින් නැවත ප්‍රියමනාප ස්ථානයකට කරනු ලබන ඉල්ලීම් සලකා බලනු ලබන්නේ එම සේවා ස්ථානවලට අතිදුෂ්කර, දුෂ්කර හා අපහසු නොවන සේවා ස්ථානවල සේවය කරන නිලධරයන් විසින් කරනු ලබන ඉල්ලීම් සලකා බැලීමෙන් පසුවය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
202[illegible]. 9. 25 දින
අනුමත කරන ලදී.
[signature]
ආණ්ඩුකාර ලේකම් (වැ. ආ.)
කුමුදිනී එස්. [illegible]

Scanned with CamScanner

**6.4 ස්ථාන මාරු කරන ආකාරය**

**6.4 අ) වාර්ෂික ස්ථාන මාරු**

ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල ක්‍රියාත්මක කෙරේ.

**6.4 ආ) වාර්ෂික නොවන ස්ථාන මාරු**

පහත දැක්වෙන හේතු මත සිදු කරනු ලබන ස්ථාන මාරු වාර්ෂික ස්ථාන මාරු වශයෙන් නොසැලකේ

4.4.1. සේවා අවශ්‍යතාවය මත
4.4.2. අන්‍යෝන්‍ය ස්ථාන මාරු මත
4.4.3. පත්කල රජයේ වෛද්‍ය මණ්ඩලයක නිර්දේශ මත
4.4.4. සේවා ස්ථානයේ වෙනසක් නොවන මාරු කිරීම
4.4.5. විනය හේතූන් මත

**6.5 ක්‍රමවේදය සහ අනෙකුත් කරුණු**

I. වාර්ෂික ස්ථාන මාරු පරිපාටියෙහි 6.2 (ආ) ඡේදය යටතට ගැනෙන සියළුම නිලධාරීන් වාර්ෂික ස්ථානමාරු අයදුම්පත ඉදිරිපත් කළ යුතුය. (උප ලේඛන 01)

II. වාර්ෂික ස්ථාන මාරු පරිපාටියෙහි 6.2 (අ) ඡේදය යටතට ගැනෙන නිලධාරියෙකු වෙනත් පාසලකට ස්ථාන මාරු වීමට ඉල්ලා ඇති විටක එම ඉල්ලීම ඉටු කිරීම සඳහා නිලධරයා ස්ථාන මාරු වීමට ඉල්ලා ඇති පාසලේ සේවය කරනු ලබන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 6.2.(ආ) ඡේදයේ සඳහන් පරිදි ස්ථාන මාරු වීමට යටත්වන හා අදාළ පාසලේ වැඩිම සේවා කාලයක් සහිත නිළධරයන් ඉන් පිටතට මාරු කරනු ලැබේ.

III. යම් පාසලකට ස්ථාන මාරු වීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇති විට 6.2 (අ) යටතේ වැඩි සේවා කාලයක් සපුරා ඇති නිලධරයන් (අනිකුත් කොන්දේසි වලට යටත්ව) එම පාසලට ස්ථාන මාරු කරනු ලැබේ.

IV ප්‍රියමනාප/ ඉතා ප්‍රියමනාප පාසල් වලට ස්ථාන මාරුවීම් ලබා දීමේ දී වඩාත් ප්‍රමුඛතාවය දක්වන්නේ අති දුෂ්කර/ දුෂ්කර පාසල්වල සේවය කළ නිළධාරීන්ට ය. මෙවැනි ස්ථාන මාරුවීම් වල දී සේවා කාලය හා නිලධරයන් ඉදිරිපත් කර ඇති ප්‍රායෝගික ගැටළු තත්ත්වයන් ද සළකා බලනු ලැබේ.

V ස්ථාන මාරු කමිටුව විසින් නිලධරයන් මාරු කිරීමේ දී පාසල් වල සේවා අවශ්‍යතාවයන් ද පාසලේ කාර්ය මණ්ඩල කණිෂ්ඨ/ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමට හැමවිටම උත්සහ කළ යුතුය.

Vi ස්ථාන මාරුවීමට කාලය සපුරා ඇති නිලධාරීන් සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නිසි වැඩපිළිවෙලක් සකස් කර ස්ථාන මාරු ලබා දීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දිය යුතුය.

(උදා - ස්ථාන මාරු ලබා දීමට සිටින නිලධරයාගේ පාසලේ රාජකාරී කල්වේලා ඇතිව වෙනත් නිලධරයෙකුට පුහුණු කිරීම)

**ගරු ආණ්ඩුකාරතුමා විසින්**
2024-07-25 දින
**අනුමත කරන ලදී.**

**ආණ්ඩුකාර ලේකම්**

### 6.5.1 සේවා කාලය ගණනය කිරීම

1. වාර්ෂික ස්ථාන මාරු වීම්වල දී සුදුසුකම් ලබන සේවා කාලය ගණනය කරනු ලබන්නේ වර්ෂයේ <u>දෙසැම්බර් 31</u> දිනටය.
(උදා: 2025 වර්ෂයේ ස්ථානමාරුවීම් සඳහා කාලය ගණනය කරනු ලබන්නේ 2024.12.31 දිනටය.)

2. සේවා කාලය ගණනය කිරීමේ දී සේවය ආරම්භක දිනය ලෙස සැළකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස 01 වන දිනයයි. නමුත් නිලධාරියාගේ පාලන විෂය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම්, ස්ථාන මාරු කමිටුව ඒ පිළිබඳව සැළකිල්ල යොමු කරයි. (තවද, නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සඳහා ගණන් ගනු නොලැබේ.)

3. පාසලක් ස්ථාපිතවීම හෝ අහෝසිවීම හේතුවෙන් එක් පාසලක සිට වෙනත් පාසලකට අනුයුක්ත කිරීමට සිදු වූ නිලධරයන් සම්බන්ධයෙන් සේවා කාලය ගණනය කිරීමේ දී අහෝසි කරන ලද පාසලේ සේවා කාලය ද අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය අවම සේවා කාලය සඳහා ගණන් ගනු ලැබේ.

## 07. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත්වන නිලධරයන්

7.1 ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධරයන් කිසියම් පාසලක අවම වශයෙන් වසර 03ක් වත් සේවය කර තිබීම ස්ථාන මාරුවක් සඳහා අයදුම් කිරීමට සුදුසුකමක් වේ.

7.2 අ) පළාත් පාසල්හි ස්ථිර විදුහල්පති වශයෙන් පත් කර ඇති නිලධාරීන් ඇතුළුව අඛණ්ඩව වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියළුම නිලධාරීන් ස්ථාන මාරුවීමට යටත් වේ.

ආ) වාර්ෂික ස්ථාන මාරු සිදු කිරීමේ දී පළාත් පාසල්හි විදුහල්පතිවරු ලෙස සම්මුඛ පරීක්ෂණයකින් පත් කරන ලද නිලධාරීන් අතර පමණක් ස්ථාන මාරු සිදුකරනු ලැබේ. තවද පළාත් පාසල්හි ස්ථිර විදුහල්පති තනතුරුවල ඇතිවන පුරප්පාඩු සඳහා වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය අනුව ස්ථාන මාරු කරනු නොලැබේ.

7.3 ස්ථාන මාරු ඉල්ලුම් කරන හා ස්ථාන මාරුවලට යටත්වන නිලධරයන් තමන් ස්ථාන මාරු ලැබීමට කැමති ස්ථාන තුනක් සඳහන් කරමින් ස්ථාන මාරුවීම් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළහොත් එහි සඳහන් සේවා ස්ථානයට මාරුවීම ලබාදීමට උත්සාහ දරන අතර ඉල්ලා ඇති ස්ථානයට මාරුවීම ලබා දීමට නොහැකි වුවහොත් මාරුවීම් මණ්ඩලයේ අභිමතය පරිදි ඔවුන්ට වෙනත් සුදුසු පාසලක් ලබාදෙනු ඇත.

7.4 ස්ථාන මාරුවීම් ලබා දීමේදී එකම පාසලක වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන්ගේ සේවා කාලය අවරෝහණ පිළිවෙලින් ගණනය කර ඒ අනුව පිටතට

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024. 4. 25 දින
අනුමත කරන ලදී.
[signature]
ආණ්ඩුකාර ලේකම් (වැ.බ.)
කුමාරි. එස්. ප්‍රේමචන්ද්‍ර



Scanned with CamScanner

මාරුවීම ලබා දේ. **එකම පාසලකට කිහිප දෙනෙක් අයදුම්කර ඇති විට මාරු මණ්ඩලය විසින් ප්‍රකාශිත නිර්ණායක අනුව වැඩිම ලකුණු ලබාගන්නා ඉල්ලුම්කරුට අවස්ථාව ලබාදේ.**

7.5 භාර්යාව සහ ස්වාමි පුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත අය නම් එම දෙදෙනාටම ඔවුන්ගේ ඉල්ලීම අනුව එකම ප්‍රදේශයක සේවය කරන්නට ඉඩ ලබාදීමට මාරු මණ්ඩල හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතුය.

**7.6 වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් නොවන නිලධරයන්**

(අ) නිලධරයාගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු මත හා සේවා අවශ්‍යතාව මත මිස නැත්නම් සාමාන්‍ය වශයෙන් වයස **අවුරුදු 58 ඉක්මවූ** නිලධරයන් කලාපයෙන් පිටතට මාරු නොකළ යුතු අතර කලාපය ඇතුළත ස්ථාන මාරු කළ හැක. නමුත් කාර්ය සාධනය මත පාසලේ ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන අභිවෘද්ධිය පෙරදැරි කරගෙන මෙම නිලධරයන්ට ද ස්ථාන මාරුවීම් ලබාදිය හැක.

7.7 පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශ ගතව සිටින අවස්ථාවන් වැනි පිළිගත හැකි කරුණු සහිතව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශයන්ද සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන කටයුතු කළ යුතුය.

7.8 අති දුෂ්කර/දුෂ්කර/අපහසු නොවන පාසල්වල සේවය සඳහා නිලධරයන් තෝරා ගැනීමේදී පාසල් යන දරුවන් ඇති විවාහක නිලධරයන්ට වඩා අවිවාහක නිලධරයන්ද පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධරයන් ද හැකි සෑම අවස්ථාවේදීම තෝරා ගැනීමට සැලකිලිමත් විය යුතුය.

7.9 යම් කිසි ලියාපදිංචි වෘත්තිය සමිතියක මව් සංගමයේ සභාපති/ලේකම්/භාණ්ඩාගාරික හා මධ්‍යම විධායක මණ්ඩලයේ සභිකයින් මාරු කරන්නේ නම් අදාළ වෘත්තිය සංගමයේ ලේකම්ගේ නිර්දේශය සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතුවලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කළ යුතුය. මෙම ස්ථාන මාරු කිරීම් කාර්ය පටිපාටියේ දී වෘත්තිය සංගමය යනුවෙන් හැඳින්වෙන්නේ ශ්‍රී ලංකා විදුහල්පති සේවාවේ නිලධරයන්ගෙන් සමන්විත ලියාපදිංචි වෘත්තිය සංගම් නිළධාරීන්ගේ නම් සහ එක් එක් නිළධාරියා පත් කළ යුතු සේවා ස්ථාන සහ සංගමයේ වර්තමාන සාමාජික සංඛ්‍යාව පිළිබඳ විස්තර පළාත් අධ්‍යාපන ලේකම් වෙත මාරුවීම් මණ්ඩල කටයුතු කිරීමට පෙර ඉදිරිපත් කළ යුතුය.

**08. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය**

වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ කාර්යභාරය

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිහි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට සහ මෙම ස්ථාන මාරු පටිපාටියේ දැක්වෙන කරුණුවලට යටත්ව 253 I හා II වගන්තිවලට අනුව ඉහත 6.4 ඡේදයේ සඳහන් අවස්ථාවල දී අමාත්‍යාංශ ලේකම්ට නිර්දේශ ලබාදීම මාරු කමිටුවල කාර්යභාරය වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025 - 07 - 25 දින
අනුමත කරන ලදී.
[signature]
ආණ්ඩුකාර ලේකම් (වැ.බ.)
5 තුමුදිනී එස්. ද්‍රෝණමාරු

Scanned with CamScanner

8.1 පහත සඳහන් වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවනු ලැබේ.

(i) පළාත් පාසල් මාරු මණ්ඩලය

8.2 පළාත් පාසල් මාරු මණ්ඩලයේ සංයුතිය

I. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු

II. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන ආයතනික කටයුතු වල නිරත මාණ්ඩලික නිලධරයකු

III. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින වෙනත් දෙපාර්තමේන්තුවක ආයතනික කටයුතු වල නිරත මාණ්ඩලික නිලධරයකු

IV. 15% කට වඩා වැඩි සංඛ්‍යාවක් සාමාජිකත්වය දරන ලියාපදිංචි ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ වෘත්තීය සමිතියකින්ම නම් කළ නියෝජිතයෙකු

## 09. අභියාචනා මණ්ඩල කමිටුවේ සංයුතිය

9.1 වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු සංයුතිය

i. අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ii. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නම් කරනු ලබන මාණ්ඩලික නිලධාරියෙකු
iii. වාර්ෂික ස්ථාන මාරු කමිටුවට අයත් වූ නිලධරයෙකු

9.2 ස්ථාන මාරු නියෝගයන් සම්බන්ධයෙන් කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පිහිටුවිය යුතු අතර එමගින් පහත කරුණු පරීක්ෂා කර තීරණ ලබාදෙනු ඇත.

- මාරු ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්
- නිලධරයන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම් (මනාප 1, 2, 3 යන සේවා ස්ථාන ඉල්ලීම් ලෙස සලකයි)
- ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනෙන් පසුව නිලධරයන්ට සිදු වූ හදිසි විපත් කරදර අසනීප වැනි සානුකම්පිත තත්ත්වයන් පිළිබඳව පිළිගත හැකි ඉල්ලීම් නිර්දේශ සහිතව ඉදිරිපත් කර ඇත්නම් ඒවා පිළිබඳ සලකා බැලීම

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024. 07. 25 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

Scanned with CamScanner

## 10. වාර්ෂික ස්ථාන මාරු ලබාදීමේ දී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

10.1 යම් නිලධරයකුගේ කලත්‍රයා පොලිසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරිවලදී ආබාධිත තත්ත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් කළ යුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි. එසේම එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය දැක්විය යුතු වේ. මෙවැනි නිලධරයන් ප්‍රියමනාප සේවා ස්ථානයකින් පිටතට ස්ථාන මාරු කිරීමට සිදු වන්නේ නම් ඊට ආසන්නතම පාසලකට හෝ නිලධරයාගේ ඉල්ලීමට අනුව වෙනත් පාසලට මාරු කල යුතුය.

10.2 මාරු කමිටු විසින් නිලධරයන් මාරු කිරීමේදී පාසල් කාර්ය මණ්ඩලයේ කණිෂ්ඨ/ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමට ද හැකි සෑමවිටම උත්සාහ කළ යුතුය.

10.3 වාර්ෂික ස්ථානමාරු පටිපාටියෙහි 7.1 ඡේදය යටතට ගැනෙන නිලධරයෙකු වෙනත් ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විටක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එහි 7.2 අ ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එම ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් ඉන් පිටතට මාරු කළ හැක.

10.4 විදුහල්පති ශ්‍රේණිධාරීන් පාසලෙන් හා කලාපයෙන් පිටතට මාරු කර ඒ හා සම නිලධරයන් සංඛ්‍යාවක් පාසල හා කලාපය වෙත ස්ථාන මාරු කිරීමට කටයුතු කළ යුතුය.

10.5 ප්‍රියමනාප සේවා ස්ථානවලට ස්ථාන මාරුවීම් ලබාදීමේදී වඩාත් ප්‍රමුඛතාවය දක්වන්නේ ප්‍රියමනාප නොවන ස්ථානවල සේවය කල නිලධරයන්ටය.

10.6 ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී සහ අභියාචනා ඉදිරිපත් කිරීමේදී සලකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වාදෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රය අනුවම සකස් කල අයදුම්පත් පිළිබඳව පමණි.

10.7 සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් වග බලා ගත යුතුය. සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු එවා ඇති බව හෙළි වුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස් කල හා හරි වැරදි බලන නිලධරයන් වගකීමට බැඳී සිටින අතර ඒ සම්බන්ධයෙන් ඔවුන් විනයානුකූල කටයුතුවලටද යටත් වේ.

10.8 මාරු කමිටු මඟින් කලාපයෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබාදී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් සේවා ස්ථානයේ/පාසලේ රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකි වන සේ ඔවුන් මුදා හැරීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කල යුතුය.

10.9 ස්ථාන මාරුවීම් ලැබීමට ඉඩ ඇතැයි සිතන කිසියම් නිලධරයෙකු සේවා අවශ්‍යතාවය මත තවත් වර්ෂයක් තම පාසල තුළ රඳවා ගත යුතු යැයි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදහස් කරන්නේ නම්, නිර්දේශිත අයදුම්පත්‍ර යොමු කරන අවස්ථාවේදීම එම අවශ්‍යතාවය පිළිබඳ පැහැදිලි කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ ඇතිව

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025 - 01 - 25 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම් (වා. ආ.)
තුළදී.7 එන් . ප්‍රේමන්ත

Scanned with CamScanner

අමාත්‍යාංශ ලේකම් වෙත තම ඉල්ලීම ඉදිරිපත් කල යුතු වේ. ඒ අනුව මාරු කමිටුවලට ඒ පිළබඳව දැනුම් දී ක්‍රියා කරනු ඇත. එක් වතාවකදී මෙම අවස්ථාව ලබා දී ඇති නිලධරයෙකු සඳහා නැවත අවස්ථාවක් ලබාදෙනු නොලැබේ.

## 11. වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් වාර්ෂික ස්ථාන මාරු කමිටු පත් කරනු ලැබේ.

| අනු අංකය | කාරණය | කාල සීමාව |
|---|---|---|
| 11.1 | ස්ථාන මාරු දැන්වීම පළ කිරීම | ජූනි 30 දිනට පෙර |
| 11.2 | ස්ථාන මාරු කමිටු පිහිටුවීම | ජූලි 15 දිනට පෙර |
| 11.3 | ස්ථාන මාරු අයදුම්පත් කලාප අධ්‍යාපන කාර්යාල වෙත කැඳවීම | ජූලි 31 දිනට පෙර |
| 11.4 | ස්ථාන මාරු ඉල්ලීම් වලට අදාළ තොරතුරු ස්ථාන මාරු කමිටුව වෙත යොමු කිරීම | අගෝස්තු 10 දිනට පෙර |
| 11.5 | ස්ථාන මාරු තීරණ දැනුම් දීම | සැප්තැම්බර් 15 දිනට පෙර |
| 11.6 | අභියාචනා සළකා බැලීම | සැප්තැම්බර් 30 දිනට පෙර |
| 11.7 | ස්ථාන මාරු අභියාචනා අවසාන තීරණ දැනුම් දීම | නොවැම්බර් 01 දිනට පෙර |
| 11.8 | ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම | එළඹෙන වසරේ ජනවාරි 01 දින සිට |

** මෙම කාල සටහනෙහි ඇතුලත් දින වකවානු සුදුසු පරිදි වෙනස් කිරීමේ බලය පළාත් අමාත්‍යාංශ ලේකම් සතු වන්නේය.

## 12 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර

12.1 ස්ථානමාරු පිළිබඳ කරුණු දැක්වීමට අවශ්‍ය නිලධරයන් කාර්ය පටිපාටික රීති නීති 16 පරිශිෂ්ටය ප්‍රකාරව (උප ලේඛන 02) දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් තම ඉල්ලීම <u>අභිනියෝජිත බලධරයා</u> වෙත ඉදිරිපත් කල යුතුය. එහි පිටපතක් ඍජුවම අදාළ බලධරයා වෙත අවශ්‍ය නම් ඉදිරිපත් කිරීමටද අදාළ රජයේ නිලධරයාට අවසර ඇත. ස්ථානමාරුවක් ලද විදුහල්පති සේවයේ නිලධරයෙකු එම ස්ථානමාරුවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කළ අවස්ථාවක එම අභියාචනයට පිළිතුරක් ලැබෙනතෙක් දැනට සේවය කරන පාසලේ සේවය කිරීමට ඉඩ සලසා දිය යුතුය. අභියාචනා මණ්ඩලයේ තීරණය මසක් ඇතුළත අදාළ විදුහල්පති සේවයේ නිලධරයාට ලබාදිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024 . 07 . 25 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

13 නිලධරයන්ගේ වගකීම

වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධරයන් නියමිත දිනයේදී නව රාජකාරි ස්ථානය වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳී සිටී.

14 පද සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම

14.1 "ගරු ආණ්ඩුකාරතුමා"යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා/තුමිය වේ.

14.2 "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා වේ.

14.3 "දෙපාර්තමේන්තු ප්‍රධානියා/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වේ.

14.4 "වෘත්තීය සංගම්" යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින්ගේ කාර්යපරිපාටිවල සඳහන් ආකාරයට නියෝජනය සහිත අනුමත හා ලියාපදිංචි වෘත්තීය සංගම් වේ.

14.5 "නියමිත දිනය" යන්නෙන් වාර්ෂික ස්ථාන මාරු වීම ක්‍රියාත්මක වන දිනය අදහස් වේ.

14.6 "ආයතන ප්‍රධානියා/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ" යනුවෙන් මධ්‍යම පළාත් අධ්‍යාපන කලාපයක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වේ.

14.7 "අභිනියෝජිත බලධරය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024 - 07 - 25 දින
අනුමත කරන ලදි.

ආණ්ඩුකාර ලේකම් (වැ. බ.)
තුසිත් ඩබ්. ලේකම්



Scanned with CamScanner

උප ලේඛන - 01

## මධ්‍යම පළාත් සභාවට අනුයුක්ත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රය

1. සම්පූර්ණ නම :- ..........................................................................................................
   1.1. ජාතික හැඳුනුම්පත් අංකය :- ..........................................................................

2. ස්ථිර පෞද්ගලික ලිපිනය :-...........................................................................................
   ...........................................................................................
   2.1.දැනට පදිංචි ස්ථානයේ ලිපිනය :- ...........................................................................
   ...........................................................................
   2.1.1දුරකථන අංකය :- රාජකාරි.............................
   පෞද්ගලික.............................

3. උපන් දිනය :- ............................... වයස:- අවු........ මාස........ දින.......
   3.1. ස්ත්‍රී / පුරුෂ භාවය :- ....................

4. වර්තමාන සේවා ස්ථානය :-.................................................................................................
   4.1. වර්තමාන සේවා ස්ථානයේ ලිපිනය :-.....................................................................
   .....................................................................
   4.2. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය:- ...........................................................

5. විවාහක/ අවිවාහක බව :-.............................
   5.1 දරුවන් පිළිබඳ තොරතුරු (අදාළ වේ නම්)

| දරුවන්ගේ නම | වයස | ඉගෙනුම ලබන පාසල |
|---|---|---|
| | | |
| | | |
| | | |

5.2 කලත්‍රයාගේ නම :- ........................................................................................
   5.2.1. කලත්‍රයාගේ සේවා ස්ථානය :- ...............................................................
   5.2.2. කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිසියේ සේවයේ ක්‍රියාත්විත සේවයේ නියුතුද:-......
   5.2.3. එසේනම් ඔහු/ඇය අයත් වන සේවාව හා තනතුර :- .............................................

5.3 දැනට දරණ තනතුර :-........................................................................................
   5.3.1. දැනට සිටින පන්තිය හෝ ශ්‍රේණිය:- ...........................................................
   5.3.2. එම පන්තියට ශ්‍රේණියට පත් වූ දිනය :- .......................................................
   5.3.3. මුල් පත්වීම් දිනය:- ...................................................................................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024.07.25 දින
අනුමත කරනු ලදී.
(signature)
ආණ්ඩුකාර ලේකම් (වැ. ආ.)
තුෂාරි එස්. ඉලේපෙරුම



Scanned with CamScanner

6. සේවයට ඇතුළත් වූ දින සිට මේ දක්වා සේවය කර ඇති සේවා විස්තරය (අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සැපයීම නොකළ යුතුය.)

| පළාත් පාසල | වර්ගීකරණය අනුව සේවා ස්ථානයේ වර්ගය (අති දුෂ්කර/ දුෂ්කර/ අපහසු නොවන/ ප්‍රියමනාප/ ඉතා ප්‍රියමනාප) | කාලසීමාව | | මුළු සේවා කාලය |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |
| | | | | |
| | | | | |

7. කාර්යසාධන ඉලක්ක සපුරා ගැනීම පිළිබඳ විස්තර (සනාථ කිරීම සඳහා ලිඛිත තොරතුරු සපයා තිබීම අත්‍යවශ්‍යයි) ..........

..........

..........

..........

8. ස්ථාන මාරුව ඉල්ලා සිටින පළාත් පාසල්:-

8.1 ..........

8.2. ..........

8.3. ..........

9. ස්ථාන මාරු ඉල්ලීමට හේතු:-

9.1 ..........

9.2 ..........

9.3 ..........

10. විශේෂයෙන් සඳහන් කිරීමට හේතු ඇත්නම් :-

..........

..........

..........

..........

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි. මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

දිනය:- .......... අත්සන..........

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-07-25 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම් (ව.ප.)

## II කොටස

**11. දැනට සේවය කරන පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලයේ අධ්‍යක්ෂගේ නිර්දේශය**

11.1 ඉහත විස්තර දැක්වෙන නිලධාරියා/නිලධාරිනිය විසින් සදහන් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත් එම නිලධාරියා/නිලධාරිනිය සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත් සහතික කරමි.

11.2 ඉහත නිලධාරියා/නිලධාරිනිය නිදහස් කිරීමෙන් ඇති වන පුරප්පාඩුව සඳහා

i යෝජනා කරන නිලධාරියාගේ නම - ......................................................................

ii සේවය - ......................................................................

iii ශ්‍රේණිය - ......................................................................

iv තනතුර - ......................................................................

11.3 මෙම පත්කිරීම හේතුවෙන් ජ්‍යෙෂ්ඨත්වය පිළිබඳ ගැටළුවක් ඇතිවේද?/නොවේද? .................

11.4 සේවය කරන පාසලේ දැනට සිටින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ / ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් පිළිබඳ තොරතුරු

| අනු අංක | නම | දැනට සිටින විදුහල්පති ශ්‍රේණිධාරීන් සංඛ්‍යාව | | | අනුමත විදුහල්පති ශ්‍රේණිධාරීන් සංඛ්‍යාව | | | පාසලේ ළමුන් ගණන |
|---|---|---|---|---|---|---|---|---|
| | | විදුහල්පති | නියෝජ්‍ය | සහකාර | විදුහල්පති | නියෝජ්‍ය | සහකාර | |
| | | | | | | | | |

ස්ථාන මාරුව/ස්ථාන ගත කිරීම සඳහා අයදුම්කර ඇති ...................................................... හිමි/මයා/මිය/මෙය දැනට සේවය කරන පාසලෙන් සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව නිදහස් කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය .............................. ........................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන හා

නිල මුද්‍රාව

**12.** පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව නිදහස් කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය ................................................ ........................................

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන හා

නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024. 07. 25 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (ස. පා.)
[illegible]



Scanned with CamScanner

උපලේඛන - 02



## පරිශිෂ්ටය 16

(XVIII පරිච්ඡේදය 256 (I) හා (V) උපවගන්ති)

### .......... වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම

#### අභියාචක නිලධරයා පිළිබඳ තොරතුරු

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 1. මුලකුරු සමග නම:- | | | |
| 2. තනතුර හා පන්තිය:- (ශ්‍රේණිය) | | | |
| 3. උපන් දිනය :- අවුරුදු/මාස/දින | 4. වයස :- අවු... මාස... දින... (20... .12.31 දිනට) | 5. ජාතික හැඳුනුම්පත් අංකය:- | 6. ස්ත්‍රී/පුරුෂ භාවය |
| 7. ස්ථිර ලිපිනය :- | 8. තාවකාලික ලිපිනය:- | 9. දුරකථන අංකය<br>කාර්යාලය :-<br>පෞද්ගලික :- | |
| 10. විවාහක /අවිවාහක බව:- | 11. කලත්‍රයාගේ නම:- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය:- | |
| 13. දරුවන් ගණන:- | 14. ඔවුන්ගේ වයස:- | 15. ඉගෙනුම ලබන පාසැල්:- | |

ආ. සේවා තොරතුරු

| | |
|---|---|
| 16. තනතුරට පත් වූ දිනය:- | |
| 17. වර්තමාන සේවා ස්ථානය :- | 18.සේවා ස්ථානය පිහිටි නගරය:- |
| 19. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය:- අවු... මාස... දින... | 20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (20...12.31 දිනට) අවු... මාස... දින... |
| 21. ප්‍රතිලාභ ලබන (ප්‍රිය මනාප) සේවා ස්ථානයක/ ස්ථානවල සේවය කර තිබේද? | |

| 22. රජයේ සේවයේ සේවය කරන ලද පූර්ව සේවා ස්ථාන | සේවා ස්ථානය | ප්‍රිය මනාප සේවා ස්ථානයකි/ ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයකි. | සේවා කාලය | |
|---|---|---|---|---|
| | | | සිට අවු... මාස... දින... | දක්වා අවු... මාස... දින... |
| | 1 | | | |
| | 2 | | | |
| | 3 | | | |
| | 4 | | | |
| | 5 | | | |
| | 6 | | | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024-07-25 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්



Scanned with CamScanner

ඈ. වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න)

| | | | | |
|---|---|---|---|---|
| 23 | වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | ඇත | | ස්ථාන මාරු අයදුම් කර ඇත්නම් අයදුම් කර ඇති සේවා ස්ථාන<br>1<br>2<br>3 |
| | | නැත | | |

වාර්ෂික ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය

24. ස්ථාන මාරු චක්‍රය සමන්විත වන නිලධරයින් ගණන ......................................

| | | | |
|---|---|---|---|
| 25. ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | | |
| | නැත | | |

26. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම පිළිබඳ තොරතුරු

| | | |
|---|---|---|
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කළ සේවා ස්ථාන<br>01........................................................................<br>02........................................................................<br>03........................................................................ |
| සංශෝධනය කිරීම | | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | |

27. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණය

28. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු

1. ................................................................................................................
2. ................................................................................................................
3. ................................................................................................................

29. ඉහත හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

ඇමුණුම (01)

................................................................................................................

ඇමුණුම (02)

................................................................................................................

ඇමුණුම (03)

................................................................................................................

30. ඉල්ලා සිටිනු ලබන සහන

1. ................................................................................................................
2. ................................................................................................................
3. ................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

.............................. ..............................

දිනය අත්සන

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024. 07. 25 දින
අනුමත කරනු ලැබී.

ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය - නිර්දේශ කරමු

01.ගාමිණී රාජරත්න මහතා (සභාපති) ..............................

02.ඩබ්ලිව්.එම්.එස්.ඩී.වීරකෝන් මහතා (සාමාජික) ..............................

03.ඒ.එම්.ආර්.බී.තෙන්නකෝන් මහතා (සාමාජික) ..............................

04.එච්.එම්.ඩී.ආර්.හේරත් මහතා (සාමාජික) ..............................

05.ජේ.ඩී.කේ.වික්‍රමරත්න මහතා (සාමාජික) ..............................

06.පී.ටී.ජී.ගුණතිලක මහතා (සාමාජික) ..............................

07.සී.පී.එස්.ඉලංගසිංහ මහතා (සාමාජික) ..............................

දිනය :- 2024.07.09

---

ආණ්ඩුකාර ලේකම්,

2024.07.09 දිනැති කොමිෂන් සභා වාර්තාවේ 2024/1581 යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා යෝජිත මේම ස්ථාන මාරු කාර්ය පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය :- 2024.07.18 අත්සන : ..............................

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නිල මුද්‍රාව

---

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය

අනුමත කරමි/නොකරමි

දිනය :- 2024-07-25 අත්සන : ..............................



ආචාර්ය ලලිත් යූ. ගමගේ
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත